**තලවාකැලේ ලිඳුල නගර සභාව - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

තලවාකැලේ ලිඳුල නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වා දුන් රු.1,775,979 ක ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වසරේ ගිණුමෙන් ගලපන බව දන්වා ඇත. | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |
| (ආ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ණය වාරිකවල වටිනාකම රු.1,001,389 ක් ජංගම වගකීම් ලෙස ගිණුම්ගත නොකර දිගුකාලීන වගකීම් යටතේ දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ණය වාරික වල වටිනාකම කෙටිකාලීන වගකීම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ණය ප්‍රාග්ධනය දිගු කාලීන හා කෙටි කාලීන ලෙස වෙන් වෙන්ව හඳුනාගත යුතුය. |
| (ඇ) | බඩු වට්ටෝරු ලේඛනයේ සඳහන් පිත්තල හා සුදු යකඩ උත්සව භාණ්ඩ විෂයය 10 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේදී තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කරන බව දන්වා ඇත. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනයේ එක් අවස්ථාවකදී රු.98,700 ක වත්කම් වැඩියෙන් දැක්වීමද, එක් අවස්ථාවකදී රු.240,700 ක වත්කම් අඩුවෙන් දැක්වීමද පැවතුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් ශේෂ 08 ක විෂයයන් 11 ක වටිනාකම අදාළ උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.4.348,328 ක වෙනස්කම් පැවතුණි. | 2022 වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගිණුම් ශේෂවල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාළ උපලේඛන හෝ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.2,868,241 ක් වු ගිණුම් විෂයයන් 11 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළි ගන්නා බවත්, අදාළ නිවැරදි කිරීම් කරන බව දන්වා ඇත. | විගණන කටයුතු සඳහා අවශ්‍ය සාක්ෂි ලබාදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,578,700 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,982,550 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | රාජ්‍ය ආයතන 01 කින්, පෞද්ගලික ආයතන එකකින් හා ගෘහ ඒකක වලින් වසර 01 සිට වසර 10 දක්වා හිඟ හිටි වරිපනම් රු. 1,171,510 ක් අයකර නොතිබුණි. | ඉහළ කොත්මලේ ජලාශය ඉදි කිරීමේදී හා සීමා නිර්ණයෙන් අහිමි වූ දේපළ වලින් අයවිය යුතු වරිපනම් රු.818,362 ක් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යොමු කිරීමට ලියකියවිලි සකස් කරමින් පවතින බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

(ආ) වෙනත් ආදායම්

-------------------

| | | | |
|---|---|---|---|
| i. | 2017 වර්ෂයට පෙර සිට අයවිය යුතු රු.100,396 ක කඩ කුලී , වසර 05 ක සිට අයවිය යුතු රු.95,804 ක ඉඩම් බදු සහ වසර 08 ක සිට අයවිය යුතු රු.203,492 ක ගෙවල් කුලී, සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන නොතිබුණි. | මුදල් ගෙවීම පැහැර හරින කඩ, නගර සභාවට පවරා ගැනීම 2022 ජුලි 24 දින සභා අනුමැතිය හිමි වී ඇති බවත්, ගෙවල් කුලී අයවිය යුතු නිළධාරියා සේවය කරන ආයතනයට වැටුපෙන් අයකර එවන ලෙස දන්වා ඇති බවත් ඉඩම් බදු සම්බන්ධ පුද්ගලයින් මෙතෙක් හඳුනාගෙන නොමැති බවත් දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| ii. | සභාව සමාලෝචිත වර්ෂය සඳහා පළකරන ලද ගැසට් නිවේදනය අනුව ප්‍රචාරක දැන්වීම් පුවරු වෙනුවෙන් අයවිය යුතු රු.485,650 ක ගාස්තු අයකර නොතිබුණි. | ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන් කඩ හිමියන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2002 සිට 2021 මැයි දක්වා කාලය තුළ සභාව වෙත ලැබී අගරු වු රු.607,345 ක චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුල්‍ය රෙගුලාසි 189 හා 486 අනුව වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.349,794 ක චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් නඩු ගොනු කර රු.11,700 ක මුදලක් අය වී ඇති අතර රු.157,551 ක චෙක්පත් 03 ක ගාස්තු අය කර ගැනීම සඳහා පොලිස් පැමිණිලි 03 ක් දමා ඇති බවත්, රු.100,000 ක මුදලක් අය කර ගැනීම සඳහා නඩුවක් ගොනු කරමින් පවතින බවත් දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) | වසර 2003 සිට 2019 වර්ෂය දක්වා වසර 01 සිට වසර 18 ක කාලයක් දක්වා කර්මාන්ත 11 කට අදාළව විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබිය යුතු ශේෂය රු.6,908,217 ක් වු අතර කර්මාන්ත 13 ක් වෙනුවෙන් ගෙවිය යුතු ශේෂය රු.5,324,174 ක් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අගෝස්තු 01 දින සිට වසර 03 ක් දක්වා තලවාකැලේ ධර්මලිංගම් ශාලාව අසල සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ඉදිකළ සම්පත් පියස, ආපනශාලාවක් ලෙස පවත්වාගෙන යාමට බාහිර පාර්ශවයකට බදු දී තිබුණි. මෙම බදුකරු විසින් අවිධිමත් ලෙස ලබාගන්නා ලද ජල හා විදුලිය සැපයුම් සඳහා රු.79,940 ක විදුලි ගාස්තු හා රු.137,831 ක ජල ගාස්තු නොගෙවා තිබුණු අතර නේවාසික ස්ථානයක් ලෙසද ආයතනය භාවිතා කර තිබුණි. | බදු ගිවිසුම් ප්‍රකාරව අදාළ ගොඩනැගිල්ල නගර සභාව වෙත භාර දෙන ලෙස ලිඛිතව දන්වා ඇති අතර එසේ නොකරන්නේ නම් සභාව වෙත පවරා ගන්නා බවත් දන්වා ඇත. | සභාවේ වත්කම් නිසි ලෙස කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂය සඳහා තානායම බදු දීමට ප්‍රසම්පාදන කැඳවා සභා අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ පෞද්ගලික අභිමතය පරිදි වසර 10 ක බදු ගිවිසුමකට එළඹ තිබුණි. රු.2,016,000ක වාර්ෂික බදු කුලියකට පෞද්ගලික පාර්ශවයකට බදුදීමෙන් පසු රු.1,499,212 ක් සභා අරමුදලින් වැය කර අළුත්වැඩියා කර තිබුණි. එමෙන්ම තලවාකැලේ තානායම වසරකට බදු දී තිබියදී බදුකරු විසින් සභා අනුමැතියකින් තොරව තානායම් භූමිය තුළ වර්ග අඩි 3000 ක ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | ටෙන්ඩකරුගේ ඉල්ලීම අනුව තානායම වසර 10 කට බදු දුන් බවත්, තානායම් ගොඩනැගිල්ලට හානියක් නොවන පරිදි එම තාවකාලික ඉදිකිරීම සඳහා හිටපු ගරු සභාපතිතුමා විසින් සිය පෞද්ගලික අනුමැතිය ලබා දි ඇති බවත් දන්වා ඇත. | සභාවට වාසිදායක වන අයුරින් කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 දෙසැම්බර් 30 දිනැති මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/01 හි 1.1. ඡේදය අනුව අදාළ ආයතනය සතුව නිරවුල් හිමිකම් පවතින ඉඩම්වල පමණක් ගොඩනැගිලි ඉදිකිරීමට ක්‍රියාකළ යුතු වුවද රු.3,921,727 ක් වැයකර ඉදිකළ මිඩ්ල්ටන් සංචාරක ගිමන්හල හා මිඩ්ල්ටන් ආහාර අලෙවි මධ්‍යස්ථානය ඉදිකර තිබුණු ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය සභාව සතුව නොතිබුණි. | 2013 ඔක්තෝබර් 14 දින පැවති මහා සභාවේ තීරණ පරිදි මෙම ඉදිකිරීම සිදු කර ඇති බවත්, ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් වර්තමාන හිමිකාරීත්වය පවතින තලවකැලේ වත්ත වෙතින් ලිඛිතව විමසා ඇති බවත් දන්වා ඇත. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලිදුල සාප්පු සංකීර්ණයේ තනි මහල් කඩ කාමර ලෙස ඉදිකර සභාව විසින් ගිවිසුම් ප්‍රකාරව ලබා දී තිබුණු කඩ බදුකරුවන් විසින් දෙමහල්, තෙමහල් හා සිවු මහල් ලෙසට සභාවේ අවසරයක් නොමැතිව ඉදිකර තිබුණි. එසේ සභාව ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | කඩ කාමර මහල් ලෙස ඉදිකිරීම 2002 සිට 2005 දක්වා කාලය තුළ ඉදිකර ඇතත් සභාව සමඟ කඩහිමියන් ගිවිසුම් ගත වී ඇත්තේ 2015 වර්ෂයේදී බවත් දන්වා ඇත. | නොපමාව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |